**ශීර්ෂය 274 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අනුරාධපුරය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිළිඳුකම අඩු කිරීමේ මුලපිරීම්, බෙදා හැරීම සහ කළමනාකරණය.

(ආ) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය.

(ඇ) සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කිරීම සහ පාලනය කිරීම

(ඈ) මැතිවරණ සම්බන්ධීකරණය.

(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මෙහෙයවීම.

(ඊ) ආදායම් එකතු කිරීම.

(උ) කොට්ඨාශ මට්ටමේ සහ ගම් මට්ටමේ නිලධාරීන් හා සංවිධාන මඟින් රජයේ කටයුතු සමායෝජනය කිරීම හා නීතියේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.

(ඌ) වෙනත් අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(එ) පළාත් සභා කාර්යයන්ට සහාය වීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) පදවිය
(ආ) කැබිතිගොල්ලෑව
(ඇ) මැදවච්චිය
(ඈ) රඹෑව
(ඉ) හොරොව්පොතාන
(ඊ) ගලෙන්බිඳුනුවැව
(උ) කහටගස්දිගිලිය
(ඌ) නැගෙනහිර නුවරගම් පළාත
(එ) නාච්චාදූව
(ඒ) මධ්‍යම නුවරගම් පළාත
(ඔ) නොච්චියාගම

(ඕ) මහවිලච්චිය

(ක) තලාව

(ග) තඹුත්තේගම

(ජ) රාජාංගනය

(ට) ගල්නෑව

(ඩ) ඉපලෝගම

(ණ) තිරප්පනේ

(ත) මිහින්තලේ

(ද) පලුගස්වැව

(න) කැකිරාව

(ප) පලාගල

**1.3 විගණන විෂය පථය**

---------------------

අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 25 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම,

පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් බැරකම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කර නොතිබුණි.

### (ආ) විසර්ජන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.665,649,321 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.664,067,738 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,581,583 ක් හෙවත් සියයට 0.24 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 626,224,321 | 625,418,369 | 805,952 | 0.13 |
| මූලධන | 39,425,000 | 38,649,369 | 775,631 | 1.97 |
| එකතුව | 665,649,321 | 664,067,738 | 1,581,583 | 0.24 |

**(ii)** **අයවැය විචලනය**

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 17 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(iii)** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 30 ක් හා දෙපාර්තමේන්තු 21 ක් විසින් එකතුව රු.4,502,176,901 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.2,641,230,183 ක් හා රු.1,616,776,533 ක් වශයෙන් එකතුව රු.4,258,006,716 ක් උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එවා තිබුණු එකතුව රු.4,489,900,568 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.4,240,731,780 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 0.04 සිට සියයට 91.67 දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. අමාත්‍යාංශ 04 කින් හා දෙපාර්තමේන්තු 02කින් එවා තිබුණු රු.1,371,262 ක ප්‍රතිපාදන මුළුමණින්ම උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශ 02 කින් හා දෙපාර්තමේන්තුවක් විසින් එවා තිබුණු එකතුව රු.10,905,071 ක ප්‍රතිපාදන ප්‍රමාණය රු.4,998,603 කින් ඉක්මවා රු.15,903,674 ක් උපයෝජනය කර තිබුණි

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-----------------------------------------**

විෂය අංක 27401 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු කේවල ශේෂ එකතුව රු.3,045,457 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගෙන තිබූ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම**

**-------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.626,108 ක් වූ අතර, ඉන් රු.210,872 ක් වූ ශේෂ 2010 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

**----------------------**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වසර 02 ක් ඉක්මවූ රු.298,847 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**------------------------------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.7** **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පැවැති පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවැතුණි.

| **වත්කම් වර්ගය** | **ඒකක ගණන** | **නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය** |
|---|---|---|
| | | **වර්ෂ** |
| ගොඩනැගිලි | 01 | 05 |
| යන්ත්‍ර සූත්‍ර | 01 | 02 |

**1.8** **අනුකූල නොවීම.**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ගැසට් පත්‍රය | 264,355 | තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කළුගල් කැණීම් මත අය කළ යුතුව තිබුණු රජයේ ගාස්තු රු.264,355 ක් 2013 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටව පැවැතුණි. |
| | 436,250 | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගල් කැනීම් මත අයකළ යුතු රජයේ ගාස්තුව අදාළ රේට්යන් අනුව අය නොකිරීම නිසා 2012 සහ 2013 වර්ෂවලට අදාලව රු.436,250 ක රජයේ ගාස්තු අඩුවෙන් අයකර තිබුණි. |

| | | |
|---|---|---|
| | 469,000 | කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගල් කැණීම් මත රජයේ ගාස්තු අයකිරීමේදී රු 469,000.ක් වැඩිපුර අයකර තිබුණි. |
| (ii) 2011 අංක 22 හා 2013 අංක 18 දරන (සංශෝධන) පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | | කැබිතිගොල්ලෑව සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රු.50,000 ට වැඩි ආදායම මත උපයන විට ගෙවීම් ක්‍රමය යටතේ බදු අඩුකර ගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>-------------------------<br>XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය | | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පවතින නිල නිවාස 09 ක වසර 5 ක බදු කාලය ඉක්මවා රැදී සිටින නිලධාරින් එම නිවාසවලින් එම නිලධාරීන් ඉවත් කිරීමට හෝ දඩ මුදලක් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>-----------------------------<br>2007 ඔක්තෝබර් 05 දිනැති අංක රා/පරි/ගි/1/වි.වැ ලිපියේ (VII) ඡේදය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අයත් සියළුම ග්‍රාම නිලධාරී වසම් හි පදිංචි විශ්‍රාමිකයින්ගේ වැන්දඹු හා අනත්දරු ප්‍රතිලාභීන්ගෙන් මියගිය පුද්ගලයින් පිළිබඳ වාර්තාවක් ග්‍රාම නිලධාරී විසින් සෑම මාසයකට වරක් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් නොකිරිම නිසා මියගිය අයගේ විශ්‍රාම වැටුප් මියගිය පසුත් බැංකු වෙත ප්‍රෙෂණය කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඇ) **2013 දෙසැම්බර් 12 දිනැති අංක විවැ/පා19/හානි/පොදු දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ ලිපිය** | | මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් නැවත අයකිරීම පිළිබඳ විස්තර කාර්තුවකට වරක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

-------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

----------------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.2,469,589 ක් වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ව්‍යාපෘති 07 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇස්තමේන්තුගත පිරිවැය රු.2,025,509 ක් වූ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහළ ගල්වඩුවාගම නිකවාගම පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2013 දෙසැම්බර් 31 දිනට රු.1,589,073 ක් වියදම් කර අවසන් නොකර අතහැර දමා තිබුණි.

(ii) තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආරම්භ කර රු.2,424,740 ක් වටිනා ව්‍යාපෘති 05 ක් සමාලෝචිත වර්ෂයට පසු වර්ෂයේ ප්‍රතිපාදන සළසා නොතිබීම මත නොනිමි තත්ත්වයේ පැවතුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

--------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කැබිතිගොල්ලෑව සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වූ රු.9,175,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දින වන විට රු.2,458,009 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ගඩොල් බිත්ති බැඳ කොන්ක්‍රීට් කුළුණු ඉදිකිරීම දක්වා පමණක් කටයුතු ඉටු කර තිබුණි.

(ii) තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2012 ගම නැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද බහුකාර්යය ගොඩනැගිලි 02 කට අදාළව අත්‍යාවශ්‍ය

පහසුකම් වන වැසිකිලි, විදුලිය, තීන්ත ආලේප කිරීම හා ගේට්ටු සවි කිරීම වැනි කරුණු ඉටු කර නොතිබුණ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමාජ ආර්ථික බලපෑම් පිළිබඳව කරන ලද අධ්‍යයනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ, වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබාදීමට 2012 සහ 2013 වර්ෂවල රු.335,000 ක් ලබා දි තිබුණි. විගණිත දිනය වු 2014 සැප්තැම්බර් 18 දින වන විටත් එම මුදල් අදාළ කාර්යය සඳහා නොයොදවා ඒවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iv) 2012 දෙසැම්බර් හා 2013 ජනවාරි මස පැවති ගංවතුර නිසා පූර්ණ හා අර්ධ හානි යටතේ නිවාස අහිමි වූවන්ට නිවාස ලබාදීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කළ වැඩ සටහන මගින් ප්‍රතිලාභීන් 30 දෙනෙකු වෙත නිවාස ආධාර ලබාදීම සඳහා රු.1,191,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම වැඩසටහනේ දෙවන සහ තෙවන වාරික සඳහා සළසා තිබුණු රු.696,600 ක් විගණන දිනය වූ 2014 මාර්තු 04 දින වන විටද අදාළ ප්‍රතිලාභින්ට ගෙවා නොතිබුණි.

## 1.10 කාර්යසාධනය

2013 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ඉඩම් ගැටළු නිරවුල් නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නාච්චාදූව, කැකිරාව සහ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල වසර 01 ත් වසර 03 ත් අතර කාල පරාසයක් තුළ නිරාකරණය නොවූ ඉඩම් ගැටළු 15 ක් පැවැතුණි.

(ii) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දීමනා පත්‍ර ලබාදීමට සුදුසුකම් ලැබූ ඉඩම් කට්ටි 3,886 ක් සඳහා දීමනා පත්‍ර සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය රේඛා චිත්‍ර ලබාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් දීමනා පත්‍ර ලබාදීම සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් කච්චේරි මගින් අනුමත කරන ලද ඉඩම් බලපත්‍ර 12 ක් පමණ වසර 02 ක කාල පමාවක් සහිතව ඉඩම් කොමසාරිස් වෙත යවා තිබුණත්, එම බලපත්‍ර සකස් කිරීම විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 22 දින වන විටත් සිදු කර නොතිබුණි.

(iv) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ඉඩම් කච්චේරි මගින් 2013 ජනවාරි 21 දින ඉඩම් 10 ක් සඳහා දිගුකාලීන බලපත්‍ර ලබාදිමට අනුමැතිය ලබා දි තිබුණත්, විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 16 දින වන විටත් එම ඉඩම්වලට අදාළ දිගුකාලීන ඉඩම් බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගිනි අවි බලපත්‍ර ලබා නොගැනිම සම්බන්ධව ක්‍රියා නොකිරීම**

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ 2014 මැයි 28 දින වන විට නිකුත් කර තිබූ ගිනි අවි බලපත්‍ර 1,920 ක් අතුරින් වසර 01 ත් වසර 07 ත් අතර කාල පරාසයක් තුළ බලපත්‍ර ලබා ගැනිම පැහැර හැර තිබූ ගිනි අවි 178 ක් සම්බන්ධව විධිමත් සොයා බැලීමක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඇ) ආදායම් එකතු කිරීමේ දුර්වලතා**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) ඉඩම් ආදායම්**

කැකිරාව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පළාත් සභා ඉඩම් ලබාගත් බදුලාභින් 32 කින් ඉඩම් බදු වශයෙන් රු.3,311,644 ක් වර්ෂ 01 සිට වර්ෂ 26 ක කාල පරාසයක සිට හිඟහිටව පැවැතුණි. එසේම ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මධ්‍යම රජය සතු ඉඩම්වලින් දීර්ඝ කාලීන බදු වශයෙන් ලබා දී තිබුණු බදු ඉඩම්වලින් බදු හිමියන් 04 දෙනෙකුගෙන් අයකළ යුතු රු.448,020 ක් විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 22 දින වන විට හිඟහිටව පැවතුණි.

**(ii) වාහන බලපත්‍ර ආදායම්**

------------------------

කැකිරාව හා මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2013 දෙසැම්බර් 31 දින වන විට හිඟ වාහන බලපත්‍ර ආදායම දඩ මුදලද සමඟ රු.2,350,955 ක් වී තිබුණි.

**(ඈ) කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහනේ ප්‍රගතිය**

---------------------------------------------

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ 2008 පෙබරවාරි 13 දිනැති අංක 2008/11 දරන චක්‍රලේඛය ප්‍රකාරව වයස මාස 24 කට වැඩි සහ මාස 60 ට අඩු වයස් කාණ්ඩයේ දරුවන් සඳහා කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක පවත්වා ගෙන යන පෙර පාසල් 225 ක ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එම වැඩසටහන අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල පවත්වා ගෙන යනු ලබන පෙර පාසල් 153 ක ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඉ) ණය අයකර ගැනීමේ දුර්වලතා**

--------------------------------

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 ක් ණය අයකර ගැනීමේ පදනම මත ව්‍යාපෘති 21,423 ක් සඳහා ලබාදුන් රු.130,733,535 කින් 2013 දෙසැම්බර් 31 දින වන විට රු.22,498,793 ක් තවදුරටත් අයවීමට තිබුණි.

**(ඊ) විශ්‍රාම වැටුප් සම්බන්ධ දුර්වලතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ විශ්‍රාම වැටුප්ලාභීන්ගේ ලිපිගොනු 488 ක් අතුරින් 2005 දෙසැම්බර් 12 දිනැති අංක 6/2004(ix) දරන හා 2006 මාර්තු 20 දිනැති අංක 2/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව ලිපිගොනු 100 ක පමණ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර නොතිබුණි.

(ii) තඹුත්තේගම හා තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම ප්‍රතිලාභී 15 දෙනෙකුට වැඩිපුර ගෙවන ලද රු.1,273,691 ක් විගණිත දිනය වූ 2014 මාර්තු 04 දින වන විටත් තවදුරටත් අයකර ගැනීමට තිබුණි.

(iii) කැකිරාව කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2006 මාර්තු 20 දිනැති අංක 2/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය සාවද්‍ය ලෙස පදනම් කරගෙන විශ්‍රාම වැටුප් ගණනය කිරීම නිසා රු.1,636,931 ක් වැඩි පුර ගෙවා තිබුණි.

**1.11 මතභේදයට තුඩු දෙන ගනුදෙනු.**

**---------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2013 වර්ෂයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මල්දේනිපුර මාර්ගයේ 08 වන පටුමඟ මීටර් 50 ක් කොන්ක්‍රීට් ගල් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.588,130 ක් ගෙවා තිබුණි. මෙම අතුරු මාර්ගය එක් ප්‍රතිලාභියෙකු ආවරණයවන අයුරින් සංවර්ධනය කර තිබුණු බව භෞතිකව පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ප්‍රධාන අතුරු මාර්ගය සහ 08 පටුමඟ ඉතිරි කොටස් සංවර්ධනය වෙනුවෙන් 2014 වර්ෂයේදී වැඩසටහන් සකස් කර ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණි.

(ආ) රජරට නවෝදය 2013 වැඩසටහන යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හැන්දෑගම වානේ වත්තේ සිට කෝලිබැන්දවැව දක්වා රු.485,110 ක් වැයකර ඉදිකර තිබුණු මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වෙනත් නිවාස සහ වාසස්ථාන නොවූ වැව් රක්ෂිතයක් මැදින් ඉදිකර අවසාන මීටර් 100 පෞද්ගලික ඉඩමක් මතින් නිවසක ප්‍රවේශ ගේට්ටුවෙන් අවසන් වන ලෙස ඉදිකර තිබුණි. මෙම ව්‍යාපෘතිය එක් ප්‍රතිලාභියෙකුගේ නිවසකට ප්‍රවේශ මාර්ගයක් සකස් කර දීමට භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ගලෙන්බිඳුනුවැව හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකර තිබුණු ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් කර තිබූ අවස්ථා නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

(i) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි අ/තිඹිරිවැව විදුහල නවීකරණය කිරීමේ අවසන් ගෙවීම් වාර්තාවේ විෂය අංක 05 ප්‍රකාරව මි.මී. 40x40x5 හැඩ යකඩ (Angle Iron) වලින් රාමුව සකසා මි.මී.50x50 නිෂ්පාදිත දැල ගසා සැකසීම සඳහා වර්ග මීටර් 21.6 ක් සඳහා වර්ග මීටරයකට රු.4,089 ක්

බැගින් රු.88,322 ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද, භෞතික මිණුම් අනුව එම වැඩ විෂයයේ ඉටුකර තිබූ ප්‍රමාණය වර්ග මීටර් 19.89 ක් වූයෙන් වර්ග මීටර් 1.71 ක් සඳහා රු.6,992 ක් ඉටු කර නොතිබුණු වැඩ සඳහා ගෙවීම් කර තිබුණි.

(ii) පාසල් 02 ක ඇස්තමේන්තු වැඩ විෂයයන් 04 කට අදාළව සවිකළ යුතු රු.61,153 ක විදුලි උපාංග සවි නොකර ගෙවීම් කර තිබුණි.

(iii) පාසල් 04 ක ගෙවීම් වාර්තා අනුව කම්බි වැට ඉදිකිරීමේදී කණු 06 කට වරක් ආධාරක කණු යෙදිය යුතු වුවත්, එසේ යොදා නොමැතිව ඇස්තමේන්තුවේ සඳහන් මුළු මුදලම ගෙවා තිබුණි. ආධාරක කණු සඳහා ඇස්තමේන්තුගත මුදල වෙනම හඳුනාගත නොහැකි විය.

(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ක්‍රියාත්මක කළ අවාරයේ බී ඇණු වගාව සඳහා ගොවීන්ගෙන් සියයට 50 ක දායකය ලෙස රු.536,250 ක් ලැබී තිබුණි. විගණිත දිනය වූ 2014 ජූනි 10 දින දක්වා මාස 2 ½ ක් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නොයවා මුදල් පොතේ සටහන් නොකර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ භාරයේ තබාගෙන තිබුණි.

## 1.12 අවිධිමත් ගනුදෙනු

-------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ලංකාරාම විහාරස්ථානයේ වහළයේ ප්‍රතිසංස්කරණ කටයුතු (දෙවන අදියර) සඳහා රු.4,364,074 ක ඇස්තමේන්තුවක් මත ලංසු කැඳවා තිබුණි. ලංසු කැඳවීමෙන් පසුව ඊට ලංසුකරුවන් 15 දෙනෙකු ඉදිරිපත් වී තිබුණි. එම ලංසුකරුවන් අතරින් ඉදිකිරීම් ආයතනයක් විසින් ඉදිරිපත් කර තිබුණු රු.3,712,590 ක ලංසුව 06 වන අවම මිල වුවත්, එය ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි. නමුත් මේ සඳහා අවම මිල ඉදිරිපත් කර තිබුණු එම කාලය තුළ නොච්චියාගම හා රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තුන්වන අදියරයේ කොන්ත්‍රාත්වල නියැලී සිටි සීමිත පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කර තිබුණු රු.3,020,669 ක ලංසුව ඇස්තමේන්තුවට වඩා සියයට 30 ක අඩුවීම මත ප්‍රතික්ෂේප කර තිබුණි. මේ හේතුවෙන් රු.688,921 ක මූල්‍යමය අවාසියක් සිදු වී තිබුණි.

(ආ) නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා ලංසු කැඳවා තිබුණු අතර ඒ සඳහා ලංසුකරුවන් 10 දෙනෙකු ඉදිරිපත් වී තිබුණි. එම ලංසු අතරින් 02 වන අවම මිල වූ රු.3,494,452 ක ලංසුව ඉදිරිපත් කළ ආයතනය ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගෙන තිබුණි. නමුත් අවම මිල ඉදිරිපත් කළ ඒ වන විට නොච්චියාගම හා රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 03 වන අදියර ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින සීමිත සමාගමක් විසින් ඉදිරිපත් කළ ලංසු වටිනාකම වූ රු.3,317,270 ක් වූ මිල ගණන් ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 23 ක් අඩුවීම මත ප්‍රසම්පාදන කමිටුව ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් පළමු අවම මිල ප්‍රතික්ෂේප කිරීම නිසා රජයට රු.177,181 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන යටතේ පාසල් 12 ක නවීකරණය සඳහා සවිකිරීම් කර තිබූ රු.212,466 ක විදුලි උපාංග අනුමත පිරිවිතරවල සඳහන් ප්‍රමිතීන්ට අනුකූලව මිලදී ගෙන නොතිබුණි.

**1.13 අනාර්ථික ගනුදෙනු**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අනාර්ථික ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පහල ගල්වඩුවාගම පාලම ඉදිකිරීම් කාර්යයෙහි කොටසක් වැඩ නිම කිරීම සඳහා රු.1,583,654 ක් ගෙවීම් කර තිබුණත්, ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2014 වර්ෂයේ ප්‍රතිපාදන සළසා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් වනතුරු කරන ලද වියදමෙන් කිසිදු ප්‍රයෝජනයක් අත්වී නොතිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ගොවීන් 422 ක් වෙත රු.3,080,000 ක් වටිනා බීජ බී ළූණු කිලෝග්‍රෑම් 800 ක් බෙදා දී තිබුණි. එම බීජ බී ළූණු පැල නොවීම නිසා අවාරයේ ලොකු ළූණු වගා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත බී ළූණු කිලෝ ග්‍රෑම් 3,200,000 ක අස්වැන්න සම්පූර්ණයෙන්ම අහිමි වී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණවත් ඇගයීමක් සිදු නොකර වගකීම් විරහිතව සැපයුම්කරුවන් තෝරා ගැනීම නිසා මෙම ළූණු ව්‍යාපාතිය අසාර්ථක වී තිබුණි.

(ඇ) ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි විහාර හල්මිල්ලෑව විදුහල නවීකරණය සඳහා ව්‍යාපෘති දායකත්වය රු.500,000 ක් ද, ප්‍රජාදායකත්වය රු.209,765 ක්ද ඇතුලුව මුලුමනින්ම රු.709,765 ක්

2013 අගෝස්තු මාසයේදී වැයකර තිබුණි. 2014 ජනවාරි මාසයේ සිට මෙම පාසල වසාදමා තිබූ බැවින් රු.500,000 ක මුලු ව්‍යාපෘති දායකත්වය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) ගල්නෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කලාමැදවච්චිය උස්සාන ජල යෝජනා ක්‍රමයේ රු.7,884,141 ක් ගෙවීම් කර වැඩ අඩක් නිමකර තිබූ නමුත්, 2014 වර්ෂයේ ඉතිරි වැඩ සඳහා ප්‍රතිපාදන සළසා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් වනතුරු වැය කළ මුදලින් කිසිදු ප්‍රයෝජනයක් අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

**1.14 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) උතුරු මැද පළාත් සභාවේ නිලධාරීන්ගේ පරිහරණය සඳහා ලබාදී තිබූ දිස්ත්‍රික් ලේකම් සතු නිල නිවාස 14 ක නිල නිවාස කුලී අයවීම ඇතුළු නිවාස පාලනය වසර 10 කට ආසන්න කාලයක් දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් බැහැර වී තිබුණි. එම නිවාස සඳහා සමාලෝචිත වර්ෂය තුළ වරිපනම් ගාස්තු ද දිස්ත්‍රික් ලේකම් විසින් මහ නගර සභාව වෙත ගෙවීම් කර තිබූ නමුත්, එම නිවාස ආපසු පවරාගැනීම හෝ උතුරු මැද පළාත් සභාවට පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 යල කන්නය සහ 2012/2013 මහ කන්නයේ වී මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබූණු රු.200,000 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

**1.15 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 73 | 61 | 12 | - |
| (ii) | තෘතීයික මට්ටම | 45 | 20 | 25 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1,331 | 1,077 | 254 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 233 | 209 | 24 | - |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -- | 08 | -- | 08 |
| | **එකතුව** | **1,682** | **1,375** | **315** | **08** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 315 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.